සන්නස

නව සහස්‍රය SANNASA

සංස්කරණය/Editor
අසෝක සුබසිංහ Asoka Subasinghe

උපදේශක සංස්කාරක
ජගත් පේ එදිරිසිංහ Jagath J Edirisinghe

සංස්කරණ සහය/Asst. Editors
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක
අසෝක සිල්වා Asoka Silva

සන්නස පිරිවර

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියානි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ
Page Layout & Graphic Designs
සාමන්ත තැන්නගේ Saamantha Tennege

සමබන්ධීකරණය

NSW
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

WA
Kapila Hemantha Balage
08 9456 1972

QLD
Ananada Samaratunga
07 3372 7953

ACT
Asoka Nimalasiri
0400 429 031

SA
Chandra Eeriyagama
08 8331 2318

TAS
Anura Seneviratne
03 6327 4259

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9402 5380

පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහස්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

සංස්කාරක සටහන

නව සහස්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

මැතිවරණ නීති

ගෙවී ගිය නැගෙනහිර පළාත් සභා මැතිවරණය මෙරට ජනතාවට බොහෝ දේ පිළිබඳව නැවතත් ඇළිහින් සිතන්නට පෙළඹ වූ මැතිවරණයක් වූ බවට සැක නැත. මැතිවරණයකදී එහි නීති හා සීමාවන් ඉතිහාසය පුරා පාලකයින් කඩ කල කල බව අපි අත් දැකීමෙන් දනිමු. මෙවර මැතිවරණයේදී ද ජන්ද ලකුණු ප්‍රදර්ශනයේ පටන් බිය වැද්දීම්, අල්ලස්දීම්, හොර ජන්ද දැමීම්, පසඟැර ගැනීම් ආදී නොයෙකුත් නීති විරෝධී කටයුතු සිදු වූ බව සැඟවිය නොහැක්කකි. නීතිය යනු කුමක්ද? එය සැමට සමානව යුක්තිය ඉටු කරනවාද? නීතිය කාටත් සාධාරණ, කාටත් පොදු උන්තර්තර දෙයක් ලෙස විග්‍රහ කරන පාලකයින් එම නීතිය රැකීමට, පිළිපැදීමට ජනතාවට බල කරන අතර සැම විටම බවුහු නීතිය සිඳ බිඳ දමති. ලංකාවේ මැතිවරණ පැවැත්වෙන කාල සීමාව තුළදී මේ නීති ක්‍රියාත්මක වන ආකාරය දෙස බැලූ කල මේවා යකාට ගිය නීති ලෙස හඳුනා ගත හැක. "නීතින් යනු පාලක පංතියේ කැඩෙන්න" ලෙස මාක්ස්වාදයේ ඉගැන්වෙයි. කව්රුන් කෙසේ විග්‍රහ කළ ද මේ නීතීන් යනු සැමට සාධාරණය ඉටු කරන හෝ ඉටු කරවා ගත හැකි දෙයක් නොව එය ක්‍රියාත්මක වන්නේ බලය, ශක්තිය ඇති කොටසගේ අවශ්‍යතා අනුව බව මෙවර මැතිවරණයේදී මනාව ඔප්පු වී ඇත. පළාත් සභා මැතිවරණයක් යනු රටේ දේශපාලන බලය තීන්දු කරන්නක් නොවේ. එහෙත් එය දේශපාලන තලයේ පහළම මහජන නියෝජිත ආයතනය වන පළාත් පාලන ආයතන වල බලය දැඩිය යුත්තේ කවිරුන්දැයි යන්න තීරණය කිරීම සඳහා භාවිතා කළ හැකි හොඳම මැතිවරණය වේ. මේ මැතිවරණය නැගෙනහිර සිංහල, දෙමළ, මුස්ලිම් ජනතා ව විසින් ප්‍රයෝජනයට ගනු ලැබුවේ කෙසේද යන්න ගැන අප විමසිලිමත් විය යුතුය. ඒ අත් කිසිවක් නොව මෙරට සමාජ තලයේ දැයක ගණනාවක් වැඩි වයසෙන් පීඩනයට පත් වී ඇති ජනකොටස මෙන්ම වැඩිම වගකීමක් ඇති පිරිසද ඔවුන් නියාවෙති. එයට හේතුව නම් ඔවුන්ගේ තීරණයේ තිවැරදි භාවය වන දේශපාලනයේ තිවැරදි භාවය ද තීරණය වන බැවිනි. එකී තිවැරදි තීරණය ලබා ගැනීම උදෙසා අති විශාල ධනස්කන්දයක් හා පිවිත පරිත්‍යාගයකින් පසු නැගෙනහිර ජනතාව වෙනුවෙන් පැවැත්වුණු මැතිවරණය නිදහස් හා සාධාරණ මැතිවරණයක් යැයි පාර්ලිමේන්ත ආණ්ඩුව මැතිවරණයේ නිදහස සහ සාධාරණත්වය තීරණය කරන ලද්දේ පාදඩ ගතයේ ක්‍රියාමාර්ග වලින් වීම හින්දා සෘජුගතය. ඉතිහාසය පුරාම ක්‍රියාවට නැඟුණු මේ පන්තයේ උමතු නිර්ස්ථිත ක්‍රියාමාර්ග යළි යළිත් කලඑළි බැසීම ඉවසා දරා සිටිය හැක්කේ කවර නම් දේශප්‍රේමියෙකුටද? කුමන ප්‍රගතිශීලියෙකුට ද? සිදු වූ දේ පිළිබඳව පශ්චාත් මරණ පරීක්ෂණ අපට අවශ්‍ය නොවේ. එහෙත් අපි මෙසේ කියමු. ඉතිහාසය ඇත්තේ පුන පුනා කියන්නට හෝ නඩු මරා ගිල දමන්නට නොවේ. හොට දවස වඩාත් ගතපත් කර ගන්නටය.

කුට්ටම් පොකුණ



ආබාධිතයා සහ සිරිලංකාව

සමන්ත තැන්නගේ - 2008/06

ආබාධිතයන්ට සලකන රටවල් අතුරින් ඕස්ට්‍රේලියාව ඉහලින්ම සිටින බව අපි සත්‍ය වශයෙන්ම දැනගත්තේ මෙරටට පා තැබූ නිසාය. උපන්දා සිට මැරෙන තෙක්ම ඔවුන් රැකබලා ගැනීමට රජය කැපවී සිටී. වැඩිමහල්ලන්ටද එසේමය. වැඩිහිටි නිවාසවල සිටියද, දරුවෝ ළඟ සිටියද, ආත්මාභිමානයෙන් යුතුව ජීවිතේ සැදෑ කල ගත කිරීමට තරම් ඕස්ට්‍රේලියානු වැඩිහිටියන් වාසනාවන්තය. බස් ගාස්තුව, විදුලිරිය ගාස්තුව, බිල්පත්, වාහන ලියාපදිංචි කිරීම ආදි සියලු දේම ඔවුන්ට ලැබෙන්නේ ඉතාමත් අඩු මුදලකටය. බෙහෙත් පෙත්තේ, රෝහලේ සිට ආපදා රථ සේවාවද ඔවුන්ට ලැබෙන්නේ නොමිලියේය. අබාධිතයාටද එසේමය. ඔවුන්ට බස් රථයට නැගීමේ සිට,

ලක්ෂ්මන් කොඩිතුවක්කු

වැසිකිලියට යාම දක්වා සියලු පහසුකම් වෙළඳ සැල් කාර්යාල, අධ්‍යාපන ආයතන වැනි සියලු තැන්වලම විශේෂිත උපකරණ මෙන්ම ස්ථානද සපයාදී ඇත. මෙරටට සංක්‍රමණය වූ මාගේ මිතුරෙකුගේ මවක්, දැන් ගතකරන්නේ විශ්‍රාමික සුවයයි. ශ්‍රී ලංකා - ඔස්ට්‍රේලියාව ක්‍රිකට් තරඟවලදී ලක්වැසි බොහෝ පුරවැසියන් ශ්‍රී ලංකාව වෙනුවෙන් අත්පොලසන් නගද්දී ඇය තම දෑත් සලන්නේ ඔස්ට්‍රේලියාව වෙනුවෙනි. "මම ලංකාවෙ හිටියනම් මේ කිසිදෙයක් ලැබෙනවද ? නැහැ එහෙනම් මම අද මෙලහකටත් මැරිච්ච තැන්වල ගසුත් පැලවෙලා. මට පැන්ෂන් පඩියක් දීලා, සෞඛ්‍ය පහසුකම් දීලා මට සලකන මේ රට වෙනුවෙන් තමයි මම අත්පුඩි ගහන්නේ." ඇයගේ තර්කයේ අසාධාරණයක් නැත. කවුරුත් කැමති වන්නේ මැරෙනතුරා වැඩි ආයුෂ ප්‍රමාණයක් භුක්ති විඳ සැහැල්ලුවෙන් මිය යන්නටය. ඇය මෙරටේ රැකියාවක්ද කර නැත. මේ රට වෙනුවෙන් කිසිම සේවාවක් ද කර නැත. දරුවන් නිසා මෙරටට ආ ඇය සතුටින් ජීවිතය ගත කරයි.

ඔබත් දන්නා මේ අවුවා ටිකා මට ලිවීමට අවශ්‍ය වූයේ මෑතකදී, බුදු දහමින් පෝෂිත ශ්‍රී ලංකාවේ සිදු වූ තිරසන් ක්‍රියාවක් ඔබට හඳුන්වා දෙන්නටය. ඒ බස් කොන්දොස්තරවරයෙකු විසින් ආබාධිත වැඩිහිටියෙකුට බසය තුළදීම පහර දී මරා දැමීමයි. බසය නවත්වන්නට බෙල් එක ගසන්නට කියූ වරදට ඔහුට මැරෙනතුරු පහරදුන්

උප්පත්තියෙන් හෝ වේවා දිවිමගේ අතරමග කදී හෝ වේවා කවුරුන් හෝ අබාධිතයන් වේ නම්, අපිට මෙන්ම ඔවුන්ටද සම්පත් ලබාදෙමින්, ඔවුන්ව පුනරුත්ථාපනය කිරීම අප සැවොමගේ යුතුකමයි. එහෙත් "සසර වසන තුරු නිවන් දකින තුරු පින් කෙත හෙල රන් දෙරණේ, යළි උපදින්නට හේතු වාසනා වේවා" ගිය කියන වැඩිමහල් අමරදේව මහතා පවා බසයක ගමන් කලහොත් තල්ලු කර බිමට දමන තරුණ පරම්පරාවක් බිහිවී ඇති රටක, නැවත උපදින්නට ප්‍රාර්ථනා කරන්නේ කෙසේද ?

තිරිසනා අවුරුදු 24 ක තරුණයෙකි.

කුඩයකින් පහරදීම නිසා කුඩ මිට මොලය දක්වා යාම නිසා අවාසනාවන්ත ලෙස මියගිය එම පුද්ගලයා අවුරුදු 63ක වැඩිහිටියෙකි. මිට පෙර සිදුවූ රිය අනතුරක් නිසා කකුල් දෙකම ශල්‍යකර්මයකට භාජනය කර තිබූ ඔහුගේ පාදය ක්‍රියා කලේ ඇතුලට බද්ධ කල කෘතිම තහඩු පටි ආධාරයෙනි.

ආබාධිතයන් හා වැඩිහිටියන් වෙනුවෙන් කිසිම ආධාරයක් නැති සිරිලංකාවේ අහිංසක එම පුද්ගලයන් රජයෙන් කිසිම දෙයක් බලාපොරොත්තුවන්නේ නැත. ලබාගන්නට හැකි දෙයක් නැත. මුදලටම වහල් වූ පෞද්ගලික බස් සේවාවේ අමන රියදුරන් හා කොන්දොස්තරවරයන්ගෙන්ද ඔවුන්ට ලැබෙන කෙනෙහිලිකම් වළක්වා ගන්නට අපිට බැරිද අපි පත්කළ රජයට බැරිද ? බහැ කියන තරමටම ඒ ප්‍රශ්නය අද සංකීර්ණ වී ඇත. අවුරුදු එකිසිය ගණන් ජීවත් වන ඔස්ට්‍රේලියානු වැඩිහිටි පරම්පරාව මෙන් නොව අවුරුදු 60 - 70න් මිය පරලොව යන වයසක හා ආබාධිත පරම්පරාවක් අපට උරුමව ඇත්තේ එහෙයිනි.

අපේ පවුල් බොහෝ දෙනෙක් තම පවුල්වල ආබාධිතයන්

24 වන පිටුවට